- **දේශීය නර්තන සම්ප්‍රදාය හා බැඳි රංග වස්ත්‍රාභරණ ආකෘතියක් නිර්මාණය කරයි.**



උඩරට සම්ප්‍රදායය



පහතරට සම්ප්‍රදාය



සබරගමු සම්ප්‍රදාය

දේශීය නර්තන සම්ප්‍රදායයන්හි රංග වස්ත්‍රාභරණ සහිත ඡායාරූප තුනක් ඉහතින් දක්වා ඇත. එම ඡායාරූප දෙස හොඳින් නිරීක්ෂණය කිරීමේ දී එක් එක් සම්ප්‍රදායයන්හි රංග වස්ත්‍රාභරණවල ඇති සුවිශේෂ ලක්ෂණ පැහැදිලි ව හඳුනා ගැනීමට හැකි වේ. උඩරට වෙස් තට්ටුව සැකසීම සඳහා ලෝහමය ද්‍රව්‍ය උපයෝගී කර ගෙන ඇති බැවින් එය පළපුරුදු නිර්මාණ ශිල්පීන් විසින් සිදු කිරීම සම්ප්‍රදායය යි. ඒ හැරුණු කොට එහි අනෙක් ආභරණ කොටස් ද, පහතරට රංග වස්ත්‍රාභරණ කොටස් සහ සබරගමු රංග වස්ත්‍රාභරණ කොටස් දෙස ද බැලීමේ දී අපට පෙනෙනුයේ ඒවා නිර්මාණය සඳහා විවිධ අමුද්‍රව්‍ය යොදා ගෙන ඇති බවකි.

මෙම රංග වස්ත්‍රාභරණ සැකසීම සඳහා කඩදාසි, පත්තර, සිමෙන්ති කවර, හණ නූල්, ලී කුඩු, රෙදි වර්ග, කඩදාසි පල්ප්, කෙමිෆික්ස් වැනි ගම් වර්ග, පාස්ප, බයින්ඩින් කම්බි, පල්මානික්කම්, ස්ටේප්ලර් මැෂිම ආදි ද්‍රව්‍ය අවශ්‍ය වේ. අද තරම් තාක්ෂණය දියුණු මට්ටමක නො පැවති යුගයක මෙවන් අමුද්‍රව්‍ය එකතු කර සාදා ගත් ආභරණ නොයෙක් පාට වර්ග යොදා ගනිමින් අලංකාර කර ඇති බව පෙනේ. මේ සඳහා වැඩි කාලයක් ගත කිරීමට ද සිදු වේ.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

අද සිදු වී ඇති තාක්ෂණ දියුණුව නිසා ද, වෙළෙඳ පොළේ ඇති නොයෙක් මාදිලියේ ද්‍රව්‍ය මෙන් ම විසිතුරු ගල් වර්ග, පාට ස්ප්‍රේ වර්ග, සීකුවින්ස් ආදිය යොදා ගත හැකි නිසා ද මෙම රංග වස්ත්‍රාභරණ සකසා ගැනීම පහසුවෙන් සහ ඉක්මනින් කර ගැනීමට පුළුවන.

මුලින් ම අපි කණ්ඩායම් තුනකට බෙදී නිර්මාණය සකස් කිරීමට බලාපොරොත්තු වන නර්තන සම්ප්‍රදායයන්හි ඡායාරූප නිරීක්ෂණය කරමු. පසු ව තමන් සකස් කිරීමට බලාපොරොත්තු වන ආභරණවල ආකෘති ඇඳ ගනිමු.




ඒ සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ලැයිස්තු සකසමු.


- රබර් ෆෝම් ෂීට් 1 (Rubber Form)
- කෝඩ් නූල්
- කෙම්ෆික්ස්
- ගම් ටේප්
- ඔබට අවශ්‍ය පාට සහ හැඩ ඇති ගල් වර්ග
- පේපර් කයිෆ් 1 (කොළ කැපීමට ගන්නා කුඩා පිහියක්)
- වූල් බෝල (අවශ්‍ය පාට)
- ගෝල්ඩ් ස්ප්‍රේ කෑන්/සිල්වර් ස්ප්‍රේ කෑන්
- මාකර් පෑනක්


(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

- **උඩරට නර්තන සම්ප්‍රදායයේ වෙස් ඇඳුම් කට්ටලයේ ඉණ හැඩය සැකසීම**

- ඝන කඩදාසියක ඉණ හැඩයේ දළ සටහන ඇඳ ගනිමු.

1.


2.


3.


1. අංක යොදා ඇති කොටස් රබර් ෆෝම් එක මත තබා මාකර් පෑනෙන් එය වටා ඇති හැඩ තල ඇඳ ගනිමු.
2. අංක සහිත කොටස් වෙන වෙන ම ගනිමු.
3. එම කොටස් දළ සටහන මත ඒ ආකාරයට තබමු.
4. කෝඩ් නූලක් ගෙන රබර් ෆෝම් එක මත කෙම්ෆික්ස් ගම් තවරා කෝඩ් නූල එය මත අලවන්න.
5. එක මත කෝඩ් නූල් 3 මේ ආකාරයට අලවන්න.
6. කෝඩ් නූල වැසෙන පරිදි ගම් ටේප් අලවන්න.
7. මෙසේ අලවන ලද ඉණ හැඩය අනෙක් පැත්ත හරවන්න.
8. එය පෙනෙනුයේ (1) රූපයේ ආකාරයට යි. එය මතුපිට ගෝල්ඩ් ස්ප්‍රේ කළ හැකි ය.
9. ඉන් පසු තමන් කැමති ආකාරයට මෝස්තර නිර්මාණය කර ගැනීමට පුළුවන. උදාහරණ ලෙස (3) රූපය බලන්න.

- මේ ආකාරයට සම්ප්‍රදාය තුනට ම අදාළ රංග වස්ත්‍රාභරණ කණ්ඩායම් අතර නිර්මාණය කර ගත හැකි ය. එසේ ම ඉතා අලංකාර නිර්මාණ ඔබට ඉදිරිපත් කිරීමට හැකියාව ලැබෙනු ඇත. මෙය නිර්මාණය කිරීමේ දී පිටුපස අලවා ඇති කෝඩ් නූල් නොගැලවීම සඳහා ඔබට ද අවශ්‍ය උපක්‍රම භාවිත කළ හැකි ය.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)